ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2025.06.20 |
|---|---|---|

ආර්.කේ.ඩී ධර්මරත්න
27/4, නිදහස් මාවත,
මාතලේ.

**පැමිණිලිකාර පාර්ශවය**

යුරේෂ් නිෂාන්ත මාදුවගේ
නාගරික කොමසාරිස් (හිටපු),
මහා නගර සභාව, මාතලේ.
(පෞද්ගලික ලිපිනය : අංක 17සී,
බෝරුප්ප, ගුණ්ණෑපාන, මහනුවර)

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/KND/192/22**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාර පාර්ශවය විසින් 2022.04.27 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ තමා ජනතා විමුක්ති පෙරමුණේ මාතලේ මහා නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වූ බවත්, 2022.04.05 වන දින ජනතා විමුක්ති පෙරමුණේ විරු සැමරුම පැවැත්වීමට නියමිතව තිබූ අතර එහි ජාතික උත්සවය මාතලේ සහ වෙනත් නගර දෙකක පැවැත්වීමට නියමිතව තිබූ බවත් ය. ඒ අනුව මාතලේ නගරයේ පැවැත්වීමට නියමිත විරු සමරු සම්මන්ත්‍රණය මාතලේ මහ නගර සභාව සතු මාතලේ නගර ශාලාවේ දී පැවැත්වීම සඳහා එකී ශාලාව වෙන් කරගැනීමට මාතලේ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත 2022.02.28 වන දින ලිපියක් ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා නාගරික කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබී තිබූ බවත්, ඒ අනුව 2022.03.03 වන දින රුපියල් අටදහස් හත්සිය විස්ස (රු.8,720.00)ක මුදලක් ගෙවා 2022.04.05 වන දින පෙ.ව. 8 සිට ප.ව. 6 දක්වා කාලය සඳහා මාතලේ නගර ශාලාව වෙන් කර ගැනීමට කටයුතු කරනු ලැබූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති / தவிசாளர் / Chairman | 011- 2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011- 2505541/74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම් / செயலாளர் / Secretary | 011- 2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

එසේම, එතැන් සිට 2022.04.05 වන දින මාතලේ නගර ශාලාවේදී විරු සමරු සම්මන්ත්‍රණය පැවැත්වෙන බවට ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද නමුත්, 2022.03.30 වන දින මාතලේ මහා නගර සභාවේ විෂය භාර ලිපිකරු විසින් දුරකථන ඇමතුමක් ලබා දී අදාළ දිනයට නගර ශාලාව ලබාදිය නොහැකි බවට තමා වෙත දැනුම් දෙන ලෙසට නාගරික කොමසාරිස්වරයා විසින් උපදෙස් ලබා දුන් බව දැනුම් දුන් බවත්, ඒ අනුව තමා නාගරික කොමසාරිස්වරයා මුණගැසී නගර ශාලාව ලබාදීමට නොහැකි හේතුව ලිඛිතව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි නමුත්, ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරන ලද බවත් පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

අනතුරුව තමා විසින් මේ පිළිබඳව මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් වෙත ලිඛිතව දැන්වූ බවත්, ඔහු විසින් අදාළ ශාලාව ලබාදෙන ලෙස නාගරික කොමසාරිස්තුමා වෙත උපදෙස් ලබා දුන්නද, නාගරික කොමසාරිස්තුමන් එකී ලිපියට ද ප්‍රතිචාරයක් නොදක්වා නගර ශාලාව ලබාදීමට කටයුතු නොකළ බවත්, ඒ හේතුවෙන් විරු සමරු සම්මන්ත්‍රණය අඩපණ වූ බවත්, ප්‍රචාරණය සඳහා දැරීමට සිදු වූ විශාල වියදම හේතුවෙන් දැඩි අලාභයක් සිදු වූ බවත්, මුලින් දැනුම් දුන් ස්ථානයේ අදාළ විරු සමරු සම්මන්ත්‍රණය පැවැත්වීමට නොහැකි වීමෙන් මහජන නියෝජිතයෙක් ලෙස තමා අපකීර්තියට පත්වූ බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර පාර්ශවය වන හිටපු නාගරික කොමසාරිස් යුරේෂ් නිශාන්ත මාදුවගේ මහතා විසින් අංක CPC/MMC/WD/DO2/2022 සහ 2022.07.18 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් පැමිණිලිකරු වන ආර්.කේ.ඩී.ධර්මරත්න මහතා විසින් ඔහුගේ අංක. විවිධ/2022 හා 2022.02.28 දිනැති ලිපියෙන්, 2022.04.05 වන දින සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා නගර ශාලාව වෙන් කර දෙන ලෙස ඉල්ලා තිබුණ බවත්, ඒ අනුව තමා විසින් එය අනුමත කළ අතර, ඒ සඳහා පැමිණිලිකරු වන ආර්.කේ.ඩී.ධර්මරත්න මහතා විසින් 2022.03.03 දිනැතිව අංක. 84071 දරණ ලදුපතින් රු.8,720.00ක මුදලක් ගෙවා එදිනට ශාලාව වෙන් කර ගෙන ඇති බවත් සඳහන් කර ඇත.

එහෙත් එලෙස එදිනට ශාලාව යොදා ගැනීමට සූදානම් වන්නේ දේශපාලන කටයුත්තක් සඳහා බව පසුව දැන ගන්නට ලැබුණු බැවින්, 2022.03.28 වන දින මා විසින් නැවත පැමිණිලිකරුගේ ඉල්ලීම් ලිපියටම (2022.02.28 දිනැති ලිපිය) "රටේ පවතින තත්වය සැලකිල්ලට ගෙන දේශපාලන කටයුතු නොවන සම්මන්ත්‍රණයක් සඳහා පමණක් ශාලාව ලබා දෙන ලෙසත්, දේශපාලන කටයුතු සඳහා වෙන් කළ නොහැකි බවත්" සටහන් යොදන ලද බවත්, ඒ අනුව විෂය භාර නිලධාරිනිය විසින් 2022.03.31 වන දින පැමිණිලිකරු වන ආර්.කේ.ඩී.ධර්මරත්න මහතා වෙත දුරකථනයෙන් අමතා ඒ බව දන්වා ඇති බවත්, ඉන්පසුව තමා හමු වූ පැමිණිලිකරු වන ආර්.කේ.ඩී. ධර්මරත්න මහතා හට දේශපාලන කටයුත්තක් සඳහා ශාලාව ලබාදිය නොහැකි බව තමා විසින් දැනුම් දුන් බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, පාර්ශවය වන හිටපු නාගරික කොමසාරිස් යුරේෂ් නිශාන්ත මාදුවගේ මහතා විසින් අංක CPC/MMC/MSD/08 සහ 2023.11.30 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ඉහත සඳහන් කරුණු වලට අමතරව පැමිණිලිකරු කැඳවා එම අවස්ථාවේදී දේශපාලනික කණ්ඩායමක් පවත්වනු ලබන විරු සමරු උත්සවයට ඉඩදීම තුළින් මහජන ආරක්ෂාවට හා සාමයට බාධාකාරී වන තීරණයක් ගෙන කලබලකාරී හැසිරීමක් ඇතිවීම වැළැක්වීම මත පදනම්ව නගර ශාලාවේ ලබාදීම සිදුකළ නොහැකි බව දන්වා සිටි බවත්, එම කාලසීමාව තුළ රටේ ආර්ථික අර්බුදයක් පැවතීම, ඉන්ධන භාන්ඩ වල මිල අධික ලෙස ඉහල යාම තුළින් ජනතාව නොසන්සුන් තත්ත්වයට පත්ව සිටීම, රට තුළ මහජන උද්සෝෂණ ඉහළයාම, ඒ තුළින් රටේ සෑම ප්‍රදේශයකම අරගල පැවතීම, මාතලේ නගරයේ ද අඛණ්ඩ අරගල සිදුවීම, දිනපතා රජයට එරෙහි පෙළපාලි සහ උද්සෝෂණ පැවතීම, මෙම තත්ත්වය මත මහජන ආරක්ෂාව සහ පොදු දේපළ ආරක්ෂා කර සාමය ඇති කිරීම සඳහා නගරයට වැඩි පොලිස් ආරක්ෂාවක් ලබා දී තිබීම යනාදී කරුණු කෙරෙහිදී තම විශේෂ අවධානය යොමු කරමින් මෙම තීරණය ගනු ලැබූ බවත්, මහා නගර සභා ආඥා පනතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී තීරණය ගනු ලැබූ බවත්, එමඟින් පැමිණිලිකරුගේ මානව හිමිකම් උල්ලංඝණය වීමක් කිසිසේත්ම සිදුවී නොමැති බවත්, 2022.02.28 වන දින පැමිණිලිකරු විසින් තමා වෙත යොමු කර ඇති ලිපිය මගින් සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා යනුවෙන් දක්වා තිබීම මගින් ඔහු සත්‍ය තොරතුරු වසන් කිරීමට උත්සාහ කිරීම තුළින් ඔහුට මෙම අපහසුතාවයට මුහුණ දීමට සිදුවූ බවත් දන්වා ඇත.

මෙම පැමිණිල්ලට අදාළව 2023.10.27 දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර නාගරික කොමසාරිස් වෙනුවෙන් සහභාගී වූ පරිපාලන නිලධාරි ඩබ්.එම්.ජී.අයි.බී. විජේකෝන් මහතා විසින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර ධර්මරත්න මහතා 2022.02.28 සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා නගර ශාලාව ඉල්ලා ලිපියක් ඉදිරිපත් කළ අතර නාගරික කොමසාරිස්තුමා විසින් ඊට අනුමැතිය ලබා දුන් නමුත්, පසුව එය ජනතා විමුක්ති පෙරමුණේ "විරු සමරුවක්" බවට ආරංචියක් ලැබීමෙන් පසු අදාළ ශාලාව ලබාදීම අවලංගු කර ඒ බව නගර සභාවේ විෂය ලිපිකරු මගින් 2024.03.31 දින ධර්මරත්න මහතා වෙත දැනුම් දුන් බවත්, පසුව නාගරික කොමසාරිස්තුමාද හමුවීමට පැමිණීමෙන් පසු එතුමාද ධර්මරත්න මහතාව දැනුවත් කර ඇති බවත් ය.

එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව නම් රටේ පවතින අයහපත් දේශපාලන වාතාවරණයයි. මෙම සම්මන්ත්‍රණ කටයුත්ත සාමාන්‍ය සම්මන්ත්‍රණයක් නොවන දේශපාලන කටයුත්තක් බැවින් විශේෂයෙන් එවකට පැවැති රටේ වාතාවරණය මත ශාලාව ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත. මුලින් එය විරු සමරුවක් ලෙස ඉල්ලීම කර තිබුණේ නැති අතර සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා යනුවෙන් ඉල්ලීම කර තිබුණ නිසා අවසරය දුන්න ද පසුව එය දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම හේතුවෙන් ශාලාව ලබාදීම අවලංගු කරන ලද බව තවදුරටත් මාතලේ නාගරික කොමසාරිස්වරයා වෙනුවෙන් පෙනී සිටි පරිපාලන නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ

2022 වර්ෂයේදී මාතලේ නගරයේ දී පැවැත්වීමට නියමිතව තිබූ ජනතා විමුක්ති පෙරමුණේ විරු සමරු සම්මන්ත්‍රණය 2022.04.05 දින මාතලේ නගර ශාලාවේ දී පැවැත්වීම සඳහා එකී ශාලාව වෙන් කරගැනීමට මාතලේ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙතින් 2022.02.28 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු විසින් ඉල්ලීමක් සිදු කර ඇති බවත්, එකී ලිපියෙහි සඳහන් කර ඇත්තේ, "නගර සභාව සතු රැස්වීම් ශාලාව (Town hall) සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා 2022.04.05 දින මා වෙත වෙන් කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි" යනුවෙන් බවත් නිරීක්ෂණය වේ. එය අනුමත කරන බවට 2022.02.28 වන දින වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා විසින් සටහන් යොදා ඇති බවත් නිරීක්ෂණය වේ.
ඒ අනුව පැමිණිලිකරු විසින් ඒ සඳහා 2022.03.03 දින රුපියල් 8,720.00ක මුදලක් ගෙවා මාතලේ නගර ශාලාව 2022.04.05 වන දින පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 වෙන්කරීමට කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ. එසේ තිබියදී 2022.03.31 වන දින දුරකථන පණිවිඩයක් මගින් නගර සභාවේ විෂය ලිපිකරු විසින් නාගරික කොමසාරිස්තුමාගේ උපදෙස් මත අදාළ සම්මන්ත්‍රණය නගර ශාලාවේ පැවැත්වීම සඳහා අවසර දිය නොහැකි බවට පැමිණිලිකරු වෙත දැනුම් දී ඇති බවත්, ඒ නිසා පැමිණිලිකරු විසින් වගඋත්තරකාර පාර්ශවය වෙතින් ඊට අදාළ ලිඛිත හේතු දැක්වීමක් ඉල්ලා සිටිය ද එවැන්නක් ලබා දී නොමැති බවත් පෙනී යයි. කෙසේවෙතත් පැමිණිලිකරු විසින් මාතලේ නගර ශාලාව වෙන් කරගැනීම සඳහා අනුමැතිය ඉල්ලා යොමු කරන ලද ලිපියෙහි නැවතත් 2022.03.28 වන දින වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා විසින් රටේ පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන දේශපාලන කටයුතු නොවන සම්මන්ත්‍රණයක් සඳහා පමණක් ලබාදෙන ලෙසත්, දේශපාලන කටයුතු සඳහා වෙන් කළ නොහැකි බවටත් සටහනක් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, පැමිණිලිකරු විසින් මේ සම්බන්ධයෙන් මාතලේ පළාත් පාලන සහාකාර කොමසාරිස් වෙත 2022.04.01 දිනැතිව කරුණු වාර්තා කර ඇති බවත්, මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් පැමිණිලිකරුට හා මාතලේ මහ නගර සභාවේ නගරාධිපතිවරයාට පිටපතක් සහිතව නාගරික කොමසාරිස් වෙත යොමුකර ඇති 2024.04.01 දිනැති ලිපියෙන් පවත්නා විධිවිධාන අනුව අදාළ නගර ශාලාව ලබාදීමේ බාධාවක් නොවන බැවින් එය ලබාදීමට කටයුතු කරන ලෙසත්, යම් හෙයකින් එය සිදු කළ නොහැකි වන්නේ නම් ඒ පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා දැනුවත් කරන ලෙසත් දැනුම් දී ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා විසින් අංක CPC/MMC/MSD/08 සහ 2023.11.30 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් දක්වා ඇති කරුණක් වන්නේ 2022.02.28 වන දින පැමිණිලිකරු විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු කර ඇති ලිපිය මගින් නගර ශාලාව වෙන් කරගැනීමට අවශ්‍යව

ඇත්තේ 'සම්මන්ත්‍රණ කටයුත්තක් සඳහා' යනුවෙන් දක්වා තිබීම මගින් පැමිණිලිකරු සත්‍ය තොරතුරු වසන් කිරීමට උත්සාහ කර ඇති බවත්, එදිනට පැවැත්වීමට සූදානම් වන්නේ දේශපාලන කටයුත්තක් බව තමා පසුව දැනගත් බවත් ය. එසේනම් මුල් අවස්ථාවේදීම ඒ සඳහා අනුමැතිය ලබා දීමට පෙර අදාළ සම්මන්ත්‍රණයේ ස්වභාවය පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙතින් විමසිය යුතුව තිබූ බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එසේම, මාතලේ මහ නගර සභාවේ වර්තමාන නාගරික කොමසාරිස්වරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අංක සීපීසී/එම්එම්සී/ඩබ්ඩී/14/2025 සහ 2025.03.27 දිනැති වාර්තාව ප්‍රකාරව 2025 වර්ෂයේ ගැසට් පත්‍රයට අනුව මාතලේ මහ නගර සභාවට අයත් නගර ශාලාව වෙන් කරදෙනු ලබන කටයුතු මොනවාද යන්න සඳහන් කර ඇති අතර එලෙස වෙන් කරදෙනු ලබන එක් කටයුත්තක් ලෙස 'ලියාපදිංචි දේශපාලන පක්ෂවල රැස්වීම් සඳහා' යනුවෙන් සඳහන් කර ඇත. මෙම පැමිණිල්ලට අදාළ ප්‍රශ්නගත සිදුවීම උද්ගත වූ 2022 වර්ෂයේදී ද නතර ශාලාව වෙන් කරදෙනු ලැබුවේ එකී කටයුතු සඳහාම බව මාතලේ මහ නගර සභාව වෙතින් සිදු කළ විමසීමේ දී දැනුම් දී ඇත. ඒ අනුව 'ලියාපදිංචි දේශපාලන පක්ෂවල රැස්වීම් සඳහා' මාතලේ නගර ශාලාව වෙන් කරදෙනු ලබන්නේ නම් මෙම පැමිණිල්ල තුළින් ප්‍රශ්නගත සිදුවීමට අදාළ ජනතා විමුක්ති පෙරමුණ යනු ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දේශපාලන පක්ෂයක් වන බැවින් එකී පක්ෂය මගින් සංවිධානය කරනු ලබන විරු සැමරුමක් සඳහා නගර ශාලාව වෙන් කර ගැනීමට ඉල්ලීමක් සිදු කිරීමට පැමිණිලිකරු හට අවස්ථාව පවතින බව නිරීක්ෂණය වේ.

ඒ අනුව මුල් අවස්ථාවේදී එනම්, 2022.02.28 වන දින නගර ශාලාව ලබාදිය හැකි බවට වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කර ඇති බවත්, ඉන් මසකට පසුව එනම්, 2022.03.28 වන දින නගර ශාලාව ලබාදිය නොහැකි බවට සටහන් යොදා ඇති බවත්, එයිනුත් දින තුනකට පසුව එනම්, 2022.03.31 වන දින පැමිණිලිකරු වෙත එලෙස ලබාදීමේ හැකියාවක් නොමැති බව වාචිකව දැනුම් දී ඇති බවත් පෙනී යන බැවින් අදාළ විරු සැමරුම පැවැත්වීමට නියමිතව තිබූ 2022.04.05 වන දිනට දින පහක් පමණ තිබියදී අදාළ ස්ථානය ලබාදීමට හැකියාවක් නොමැති බවට දැනුම්දීම තුළින් වෙනත් ස්ථානයක් සොයා ගැනීමට සිදුවීම, එම ස්ථානය පිළිබඳව නැවතත් ජනතාව දැනුවත් කිරීමට සිදු වීම සහ පූර්වයෙන් සිදු කරන ලද ප්‍රචාරණ කටයුතු සඳහා දැරූ වියදම අපතේ යාම වැනි ගැටලු වලට මුහුණ පෑමට සිදු වූ බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශයන් පිළිගත හැකි බව ද නිරීක්ෂණය වේ.

මෙලෙස පැමිණිලිකරු විසින් මසකට අධික කාලයකට පෙර අදාළ ඉල්ලීම සිදු කර මුල් අවස්ථාවේ දී ඊට අනුමැතිය ලබා දීම හේතුවෙන් අදාළ මුදල් ද ගෙවා නිසි පරිදි නගර ශාලාව වෙන් කරවාගෙන අදාළ සැමරුම පැවැත්වෙන බවට ප්‍රචාරණ කටයුතු ද සිදු කර තිබියදී එය පැවැත්වීමට ඉතාම ආසන්නව තිබිය දී නගර ශාලාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම තුළින් පැමිණිලිකරු හට එකී සැමරුම

මාතලේ නගර ශාලාවෙහි පැවැත්වීම සඳහා පැවති නීත්‍යානුකූල අපේක්ෂාව කඩ වී ඇති බව ද නිරීක්ෂණය වේ.

එසේම, රටේ පැවති දේශපාලනික තත්ත්වයන් හේතුවෙන් නගර ශාලාව ලබා දීම වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කළ ද 2022.04.05 වන දින මාතලේ ගාන්ධි උත්සව ශාලාවේ දී අදාළ විරූ සැමරුම කිසිදු කලහකාරී සිදුවීමකින් තොරව පැවැත්වූ බව ද පැමිණිලිකරු විසින් පෙන්වා දී ඇති බව ද නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකරු විසින් නිසි පරිදි ලිඛිතව තම ඉල්ලීම සිදුකර මාතලේ නගර ශාලාව වෙන් කර ගැනීම සඳහා කටයුතු කර තිබෙන බවත්, නගර ශාලාව ලියාපදිංචි දේශපාලන පක්ෂවල රැස්වීම් සඳහා වෙන් කර දීමට ප්‍රතිපාදන පවතින බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් මුල් අවස්ථාවේදී පැමිණිලිකරු හට නගර ශාලාව ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී පැමිණිලිකරු අදාළ සැමරුම පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නැවත සම්පාදනය කරගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොතිබිය දී අදාළ අනුමැතිය අවලංගු කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1)ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ සිදු කර සිටී.**

1. වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ මහ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා වන යුරේෂ් නිශාන්ත මාදුවගේ යන අය විසින් පැමිණිලිකරු වෙත රුපියල් දසදහස (රු.10,000.00)ක මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. වගඋත්තරකාර පාර්ශවය වන මාතලේ මහ නගර සභාවේ හිටපු නාගරික කොමසාරිස්වරයා වන යුරේෂ් නිශාන්ත මාදුවගේ යන අය විසින් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 08 . 04 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය, කොළඹ 07.
- කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය, කොළඹ 07.
- අවශ්‍ය පියවර ගැනීම සඳහා